# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

නීතිඥ එස්.එල්. ඉරෝෂා උදයන්ති
සමරතුංග,
කුසුම් සෙවණ, මුත්තෙට්ටුපිට,
හිදැල්ලන,
රත්නපුර.

**අභියාචක**

**අභියාචනා අංකය : 197/2021**

එදිරිව

ඉඩම් කොමසාරිස් ජනරාල්
දෙපාර්තමේන්තුව,
මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී ය.** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක නැත
පොදු අධිකාරිය නැත

**ලිඛිත සැළකිරීම්** : පොදු අධිකාරිය - 2020.10.06, 2021.10.18
අභියාචක - 2021.07.19

**විභාග කළ දිනය** : 2022.08.22

**තීරණය කළ දිනය** : 2022.08.22

**කොමිෂන් සභාවේ තීරණය**

2021.07.19 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති ලිපිය කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු විය. එම ලිපිය මගින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ,

*"ඉහත අභියාචනය ඔබ වෙත යොමු කිරීමෙන් අනතුරුව 2020.12.02 දිනැතිව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු තොරතුරු නිලධාරී විසින්, මා විසින් 2020.06.10 දිනැතිව කරන ලද තොරතුරු ඉල්ලීමට අදාල තොරතුරු මා වෙත ලබා දී ඇති බව දන්වා සිටිමි."* යනුවෙනි.

එකී කරුණු සළකා බලා මෙම අභියාචනය තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවන හෙයින් අභියාචනය අවසන් කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.